# එලීනා සහ රියානා



නදෙව්නි ටමාෂා විජේසුන්දර

# එලීනා සහ රියානා

නදෙව්නි ටමාෂා විජේසුන්දර

**ISBN - 978-624-206-764-3**

කෘතිය පළ කරන දිනය - **15.11.2023**

කතෘගේ වෙනත් කෘති - අපූරු තෑග්ග

රජතුමාගේ උපාය

**Guzz** පූසාගේ අපූරු චාරිකාව

පූසාගේ බඩරිදිල්ල

**Liza's Dream**

# පිදුම

මෙම කෘතිය ලිවීමට මට උදව් උපකාර කළ

මගේ ආදරණීය

අප්පච්චීට, අම්මාට, ලොකුඅම්මාට,

අත්තාට, අත්තම්මාට සහ

චූටි නංගීටත්,

නිරතුරුවම මා දිරිමත් කරමින් යහමඟ පෙන්වන

ආදරණීය සමන්මලී ගුරුතුමියටත්

ඉතා සෙනෙහසින් හා ගෞරවයෙන් පුදමි.

# පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් ඵලදායී පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන් ම ප්‍රඥා සම්පන්න දැනුමෙන් යුත් බහු විධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩ නැගීම අපේක්ෂාව යි එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත් කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි. එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මගපෙන්වීම යටතේ ලේඛනකරණය සහජයෙන් උරුම කරගත් මහාමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරි කොට ගෙන ග්‍රන්ථ කරණයට යොමුකිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි.

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩ නැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැළපෙන ලෙස නවීකරණය කරමින් "දිවිය දිනන විද්‍යුත් පොතක් "ව්‍යාපෘතිය හඳුන්වා දෙන ලදි දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත් කතුවරයෙකු වීම හරහා ජීවිතයට එකතු වන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යාංශ අනුමැතියෙන් රටේ ම පාසල් දරුවත් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගය කරමි.

2023 සාහිත්‍ය මාසයට සමගාමී ව අප පාසල විසින් සංවිධානය කළ 'දිවිය දිනන විද්‍යුත් පොතක් "ව්‍යාපෘතියට එක්වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුණු අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවායි ප්‍රාර්ථනා කරමු.

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක් වූ අප පාසලේ කළමනාකරණ මණ්ඩලය ගුරු භවතුන් දෙමාපියන් ආදි ශිෂ්‍යාවන් සෙසු පාසල් වල දරුවන් යොමුකළ විදුහල්පතිවරුන් ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තුතිය මෙමගින් පිරිනමමි.

ශෂිකලා සේනාධිර

විදුහල්පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර

**2023.11. 01**

# එලීනා සහ රියානා

එකමත් එක කාලෙක කරුණාවන්ත රජතුමෙක් විසින් පාලනය කළ ලස්සන රාජධානියක් තිබුණා. කෙත් වතු වලින් සශ්‍රීක වෙලා තිබුණ මේ රාජධානියේ මිනිසුන් ඉතාමත් සතුටින් වාසය කළා. ඒ සතුට තවත් වැඩි කරමින් රජ බිසවට ලස්සන පුංචි දියණියක් ලැබුණා. ඉතාමත් සතුටට පත්වුණ රජතුමා විශාල රාජකීය සාදයක් සූදානම් කළා. ඒ සාදයට දුප්පත්, පොහොසත්, බාල, මහලු සියලුම දෙනාට ආරාධනා කළා. සාදයට පැමිණි ඔවුන් කා බී විනෝද වුණා. නමුත් රජතුමාට අතපසුවීමකින් රාජධානියේ හිටිය නපුරු බලගතු මන්තරකාරියෙකුට සාදයට ආරාධනා කිරීමට අමතක වුණා. සාදය ගැන දැනගත්ත මන්තරකාරිය ඉතාමත් කෝපයෙන් රජ මාළිගාවට ගිහින් රජතුමා හමු වුණා.

"රජතුමනි, සියලුම රට වැසියන්ට සාදයට ආරාධනා කළත් මේ තරම් බලගතු මට ඊට ආරාධනා නොකිරීමෙන් ඔබ මට විශාල අගෞරවයක් සිදුකළා. එය මට විශාල අවමානයක්. ඊට දඬුවමක් විදියට ඔබේ කුඩා දියණියට විසි අවුරුද්දක් වෙනකම් රජ මාළිගාවෙන් පිටමං කරන්න ඕනේ. ඒ අතරතුර ඇය සමඟ කිසිම සම්බන්ධතාවයක් තබාගන්න

තහනම්. එහෙම නොකළොත් මම මගේ බලයෙන් මුළු රාජධානියම විනාශ කරලා දානවා."



එහෙම කිව්ව මන්තරකාරිය ඇගේ මැජික් යෂ්ටියෙන් පුංචි කුමාරිකාවගේ දණහිසේ කතිර ලකුණක්ද සළකුණු කරලා යන්න ගියා.

හැමෝම මේ ගැන දුකටත්, බියටත් පත්වුණා. රජ බිසව මීට කොහෙත්ම කැමති නොවුණත් මායාකාරියගේ බලය ගැන දන්නා රජතුමා රජධානියේ ආරක්ෂාව වෙනුවෙන්

කුමාරිකාව විශ්වාසවන්ත සේවිකාවක් සමඟ මාළිගාවෙන් පිටත් කිරීමට තීරණය කළා. ඊට කලින් රජතුමා සේවිකාවට ඔහුගේ රාජකීය මුද්‍රව ලබාදී,

"මාගේ දියණියට අවුරුදු විස්ස සම්පූර්ණ වූ විගස මේ මුදුව ලබා දී මාළිගාවට එවන්න. එතෙක් මේ සියල්ල රහසක් ලෙස තබාගන්න."

සියල්ලන්ගේම සෝ සුසුම් මැද සේවිකාව සිඟිති කුමාරිකාව සමඟ පිටත් වුණා. ඔවුන් ඉතාමත් ඈත ප්‍රදේශයක ජීවත් වුණා. සේවිකාව කුමාරිකාවට එලීනා කියලා නම තැබුවා. කුමරිය ඇගේ මව ලෙස සිතා සිටියේ මහලු සේවිකාවයි.

සෙමෙන් සෙමෙන් විසි අවුරුද්දක් ගත වුණා. රෝගාතුර වුණ සේවිකාව කුමරියගේ විසිවන උපන්දිනය දා ඇයව කැඳවූවා.

"දියණියනි, ඔබට කීමට විශාල රහසක් තිබෙනවා. ඔබ සාමාන්‍ය ළමයෙක් නෙවෙයි. ඔබ රාජ කුමාරිකාවක්. මේ රාජකීය මුදුව රැගෙන ගොස් ඔබේ පිය රජතුමාට පෙන්වා ඔබේ උරුමය ලබාගන්න."



සියල්ල දැනගත් එලීනා කුමරිය තම දෙමව්පියන් ගැන දැන ගැනීමෙන් සතුටටත්, සේවිකාව දමා යැම පිළිබඳ දුකටත් පත්වුණා. රජ මාළිගාවට ගිය විගස ඇය කැඳවා ගෙන යාමට පැමිණෙන බව පොරොන්දු වී සේවිකාව කිවූ මං සළකුණු ඔස්සේ මාළිගාවට පිටත් වුණා.

එහෙත් කොතරම් ප්‍රවේශමෙන් ගමන් කළත් කුමරිය වනාන්තරය මැදින් යන විට පාර වැරදී මංමුළා වුණා. ඇය තව තවත් වනාන්තරය මැදට ගියා. කලබලයට හා බියට පත්වුණ ඇය ගසක් මුලට වී හඬන්නට පටන් ගත්තා.

මේ අතර රාජධානියේ තවත් කුඩා ගම්මානයක මෙවැනි සිදුවීමක් වුණා. ඒ ගම්මානයේ ඉතා දුප්පත් පැළක රියානා නම් තරුණියක් ජීවත් වුණා. ඇගේ දෙමව්පියන් කවුරුත්

හිටියේ නෑ. චිත්‍ර ඇඳීමට ඉතා දක්ෂ වූ ඇය එම චිත්‍ර විකුණා ලැබෙන මුදලින් ජීවත් වුණා. දුප්පත් වුනත් ඇගේ එකම සිහිනය වුණේ කවදා හෝ රජ මාළිගාවක ජීවත් වීමට යැමයි. ඈ ඒ ගැන දිවා රෑ සිහින මැව්වා.

දිනක් රියානා චිත්‍ර ඇඳීමට පාට සාදා ගැනීමට අවශ්‍ය ද්‍රව්‍ය සොයා ගැනීමට වනාන්තරය මැදට ගියා. නිතරම ඇය එහි යන නිසා වනාන්තරය පිළිබඳ ඇය හොඳින් දැන සිටියා. වනය මැදින් යන විට ඇයට යමෙකු හඬන ශබ්දයක් ඇසී බලන විට තරුණියක් ගසක් මුලට වී හඬමින් ඉන්නවා දැක්කා.

ඔව්. ඒ හිටියේ අපි කලින් කිව්ව එලීනා කුමරියයි. රියානා එලීනාට ළංවී,

"ඇයි ඔයා අඬන්නේ, ඔයා අතරමං වුණාද?" ඇහුවා.

රියානා දැක්ක එලීනා ඉතා සතුටට හා සැනසීමට පත්වී තමා නගරයට යැමට ගොස් අතරමං වූ බව පමණක් පැවසුවා.



"ඔයා බයවෙන්න එපා මම ඔයාව නගරයට එක්කරගෙන යන්නම්. ඒත් දැන් රෑ වේගෙන එන නිසා අද රෑ අපේ ගෙදර නැවතිලා හෙට උදේම නගරයට යමු"

රියානා එලීනාව තමාගේ පුංචි පැළට එක්කරගෙන ගිහින් හොඳින් සංග්‍රහ කළා. රියානාගේ ආගන්තුක සත්කාර නිසා සතුටට පත්වුණ එලීනා ඇය විශ්වාස කර සත්‍ය පැවසීමට සිතුවා.

"රියානා ඔයා ගොඩක් කරුණාවන්තයි. ඒ නිසා මම ඇත්ත කියන්නම්. මම තමයි මේ රාජධානියේ රජතුමාගේ දුව. අවුරුදු විස්සකින් මම පියාණන් දැක්කේ නෑ. මේ රාජකීය මුදුව ගෙන ගොස් පෙන්වූ විට ඔවුන් මාව හඳුනාගෙන රජ මාළිගාවට පිළිගනීවි."

සියල්ල ඇසූ රියානා පුදුමයට පත්වුණා. නමුත් ඇගේ කරුණාවන්තකම යටපත් වී රජමාළිගාවක ජීවත් වීමේ සිහිනය නිසාම කපටි සිතුවිල්ලක් පහළ වුණා. ඇය එලීනා නින්දට ගිය පසු රාජකීය මුදුව හොරකම් කරගෙන උදෑසනම රජ මාළිගාවට ගොස් රජතුමා හමුවුණා.

"රජතුමනි ඔබට මාව හඳුනාගත නොහැකිද? මම තමයි විසි අවුරුද්දක් ඔබෙන් ඈත් වෙලා හිටිය ඔබේ දියණිය"

එය ඇසූ රජතුමා හා බිසව පුදුමයට පත් වී "ඔබ කොහොමද එය ඔප්පු කරන්නේ?" ඇහුවා.

එවිට රියානා එලීනාගෙන් හොරකම් කළ රාජකීය මුද්‍රාව පෙන්වූවා. මුද්‍රාව පරීක්ෂා කළ රජතුමා ඉතාමත් සතුටෙන් රියානාව වැළඳගත්තා.

නමුත් ඒ සමඟම එලීනාත් රජමාළිගාව සොයා ගෙන ගොස් රජතුමා ඉදිරියට පැමිණියා.

"රජතුමනි, මැය කියන්නේ බොරු. මම තමයි ඔබේ සැබෑ දියණිය." යැයි පැවසුවා.

"එසේනම් රාජකීය මුද්‍රාව පෙන්වන්න." රජතුමා අණ කළා.

නමුත් රජතුමාට පෙන්වීමට රාජකීය මුද්‍රාව ඇය සතුව තිබුණේ නෑ. රියානා එය සොරකම් කළ බව පැවසුවත් රජතුමා එලීනාව විශ්වාස කළේ නෑ. එසේම බොරු කීමේ වරදට ඇයව සිරගත කරන්නත් රාජ පුරුෂයන්ට අණ කළා. එලීනා ඉතාමත් දුකට පත්වුණා. රාජපුරුෂයන් ඇයව සිර භාරයට

ගැනීමට පැමිණෙනවාත් සමඟ බිසවට යම් දෙයක් මතක් වුණා.

"රජතුමනි, ඔබට මතකද? මීට විසි අවුරුද්දකට කලින් එදා අර මන්තරකාරිය මාළිගාවෙන් පිටත් වී යන විට අපේ දියණියගේ දණහිසේ කතිර ලකුණක් සලකුණු කළා? අපි මේ දෙදෙනාගේ එම සළකුණ පරීක්ෂා කර බලමු. එවිට අපේ සැබෑ දියණිය හඳුනා ගත හැකි වේවි."

බිසව තරුණියන් දෙදෙනාගේම දණහිසවල් පරීක්ෂා කළා. එලීනාගේ එම සළකුණ පැහැදිලිවම තිබුණත් රියානාගේ එවැනි ලකුණක් තිබුණේ නෑ.



රජතුමා සියල්ල අවබෝධ කරගත්තා. ඔහු එලීනාව ආදරයෙන් වැළඳගෙන සමාව ඉල්ලුවා. රියානාව වහාම

සිරභාරයට ගෙන දැඩි දඬුවම් ලබාදෙන ලෙස රාජපුරුෂයන්ට අණ කළා.

බියට පත් රියානා හඬන්නට පටන් ගත්තා. රජ මාළිගාවක ජීවත් වීමට ඇති ආශාව නිසා මෙවැන්නක් සිදුකළ බව පැවසුවා.

ඒ ඇසූ එලිනා "පියාණෙනි, මම වනාන්තරයේ අතරමං වී සිටින විට මට පිහිට වුනේ මැයයි. මට කරුණාවෙන් සංග්‍රහ කළා. රජ මාළිගාවක ජීවත් වීමට ඇයට ඇති සිහිනය නිසා මෙවැන්නක් කිරීමට පෙළඹෙන්නට ඇති. ඒ නිසා අපි ඇයට සමාව දෙමු."

රජතුමා එයට එකඟ වුණා.

"පියාණෙනි, තවත් එක ඉල්ලීමක් තියෙනවා. රජ මාළිගාවේ මට කිසිම යහළුවෙක් නෑ. ඒ නිසා අපි රියානාව මෙහෙ නතර කර ගමුද? එයා චිත්‍ර අඳින්න දක්ෂ නිසා අපිට එයාව අපේ රාජකීය චිත්‍ර ශිල්පිණිය කර ගන්න පුළුවන්. මට චිත්‍ර අඳින්න ඉගෙන ගන්නත් පුළුවන්."

එලිනාගේ සතුට ගැන සිතූ රජතුමා ඊට කැමති වුණා.

රියානා එලීනාව වැළඳගෙන සමාව ඉල්ලුවා. නැවත කිසිදිනක මෙවැනි දෑ නොකරන බවට පොරොන්දු වුණා. ඔවුන් හොඳ යහළුවන් බවට පත්වුණා.

ඒ විතරක් නෙවෙයි, එලීනා කුමරිය තමන් කුඩා කාලයේදී රැකබලා ගත් මහලු සේවිකාව මාළිගාවට ගෙන්වා ගෙන සියලු සැප සම්පත් ලබාදුන්නා.

ඉන්පසු ඔවුන් සියල්ලන්ම සතුටින් ජීවත් වුණා.

නිමි.



# පසුවදන



නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමග සිදුවන සමාජ ආර්ථික පරිවර්තනයන් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීප කරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම, ඔවුන්ගේ සාහිත්‍ය නිර්මාණ හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇතිකිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යාංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථ කරණයට යොමුකරන ක්‍රියාමූලික පරියේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී. ඒ යටතේ වැඩිම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්තාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන් ය. පාසල තුළ ගොඩනැගී ඇති ලේඛන සංස්කෘතිය නව මාවතකට යොමුකරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ලඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුණු විද්‍යුත් කෘති රචනා කරන්නට විය. ඒ තුළින් සම්පාදනය වූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතර ම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනය කරන කැඩපතකි. මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි. පාසල් මට්මන් ආරම්භකර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි.

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමග එක්ව විද්‍යුත් කෘතියක් රචනා කර ජනගතකරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතු අංකුර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු.

මෙයට

සෙනෙවිරත්න මහලේකම්

පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාපක

**2023.11.01**